# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1825/15 – 2013 අගෝස්තු 27 වැනි අඟහරුවාදා – 2013.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/61/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

එච්. ඩී. කේ. එස්. ගුණසේකර මයා, නො. 130/1, පොල්හේන, මඩපාත.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්, අංක 69, වෝල්ස් පටුමග, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, නො. 213 හි එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 අගෝස්තු මස 07 වැනි දින,
කොළඹ දී ය.


1A – G 18177 – 205 (2013/08)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මගේ අංකය: IR/10/61/2012.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

එක් පාර්ශ්වයක් වශයෙන්

එච්. ඩී. කේ. එස්. ගුණසේකර මයා, නො. 130/1, පොල්හේන, මඩපාත.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ්, අංක 69, චෝල්ස් පටුමග, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

ජයා කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි වසර 4කට ආසන්න කාලයක් සහකාර වැඩ නායක තනතුරෙහි සේවය කළ එච්. ඩී. කේ. එස්. ගුණසේකර මහතාට එම තනතුර අහිමිකිරීම හේතුවෙන් යම් අසාධාරණයක් සිදුවූයේද යන්න සහ එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 ජූලි මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 - 226

---

මගේ අංකය: IR/15/19/2011.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

ඊ. පී. ආර්. ඒ. එමිල් මයා, අංක. 280/8 ඒ, ශ්‍රියාකාන්තා ගාඩ්න්ස්, වරාගොඩ, කැළණිය.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ඇෆ්නෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 56/1, කින්සි පාර, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

බොරලැස්ගමුව, පිරිවෙන පාර, නො. 128 හි එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ගාමිණී ලොකුගේ,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 අගෝස්තු මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/19/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

ඊ. පී. ආර්. ඒ. එමිල් මයා, අංක. 280/8 ඒ, ශ්‍රියාකාන්තා ගාඩ්න්ස්, වරාගොඩ, කැළණිය.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

ඇෆ්නෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 56/1, කින්සි පාර, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

01. ඇෆ්නෝ (ප්‍රයිවට්) ලිමිටඩ් හි ව්‍යාපාර සංවර්ධන කළමනාකරු ලෙස සේවය කළ ඊ. පී. ආර්. ඒ. එමිල් මහතාට 2009 ජුනි මස සිට 2010 මැයි මස දක්වා මෝටර් රථයේ ධාවන හා නඩත්තු වියදම් සහ ඉන්ධන දීමනාව ප්‍රතිපූර්නය නොකිරීම යුක්තිසහගතද යන්න සහ නොඑසේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව,

02. ඊ. පී. ආර්. ඒ. එමිල් මහතාට 2009 සහ 2010 වර්ෂවල නිවාඩු වැටුප් සඳහා හිමිකම් ලබන්නේ ද යන්න හා හිමිකම් ලබන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 ජුලි මස 24 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

09 - 227

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.